# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1383 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 26/08/2024 පැය 1530

# මාධ්‍ය නිවේදනය

## 01. කුෂ් මත්ද්‍රව්‍ය සහ මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය

2024.08.25 වන දින උදෑසන කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත පේරාදෙණිය පොලිස් වසමේදී වැටලීමක් සිදු කර **කුෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 75 ක් සහ මත් කරල් 140 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ පිළිමතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් වසම.

2024.08.25 වන දින දහවල් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත මට්ටක්කුලිය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 42 හා 43 වයස් වල පසුවන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2024.08.26 වන දින අළුයම් කාලයේ වාරියපොළ පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ නෙල්ලිය බෝක්කුව අසලදී අනුරාධපුර දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පෙරළීමෙන් අනතුරක් සිදු වී ඇත.
අනතුරින් යතුරු පැදියේ පැදිකරු බරපතල තුවාල ලබා වාරියපොළ රෝහලට ඇතුලත් කරන ලද අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ මිනුවන්ගැටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**